72474

OL/2014/61-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ..............................

## භූගෝල විද්‍යාව I

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● 1 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

1. වායුගෝලයේ අඩංගු විවිධ වායු වර්ග අතුරෙන් වැඩිපුර ම ඇත්තේ ...................................... වායුව ය.
(නයිට්‍රජන් / කාබන් ඩයොක්සයිඩ් / ඔක්සිජන්)

2. පෘථිවි ව්‍යුහය අනුව ඝනකමින් අඩු ම ස්ථරය ...................................... ය.
(කබොල / ප්‍රාවරණය / හරය)

3. පරිසර පතන ශීඝ්‍රතාව දැකිය හැකි වන්නේ ...................................... ගෝලය තුළ ය.
(පරිවර්ති / අපරිවර්ති / මෙසෝ)

4. උතුරු අක්ෂාංශ 50° - 60° අතර විහිදී ඇත්තේ...................................... වනාන්තර වර්ගයයි.
(නිවර්තන / පතනශීල / කේතුධර)

5. රබර් වගාව සඳහා වඩාත් උචිත වන්නේ ...................................... පස ය.
(ලෝම හා ලැටසෝල් / ලුණු මිශ්‍ර වැලි / කබොක් මිශ්‍ර රතු)

6. ශ්‍රී ලංකාවේ විශාලතම ධීවර වරාය පිහිටා ඇති ස්ථානය ...................................... ය.
(මීගමුව / දික්ඕවිට / ඔලුවිල්)

7. මව් පාෂාණ ජීර්ණය වී, මළ ශාක හා සත්ත්ව ද්‍රව්‍ය මිශ්‍ර වී කළු පසක් නිර්මාණය වී ඇත්තේ පාංශු පැතිකඩ අනුව ........................... මහලට අයත් කලාපයෙහි ය.
(A / B / C)

8. ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහය අනුව, ශ්‍රම බලකාය ලෙස සැලකෙන්නේ වයස අවුරුදු ................................ අතර ජන සංඛ්‍යාවයි.
(15 - 59 / 15 - 49 / 18 - 59)

9. ශ්‍රී ලංකාවේ අකුණු අනතුරු බහුලව හටගන්නේ ...................................... මාසවල ය.
(මාර්තු - අප්‍රේල් / නොවැම්බර් - දෙසැම්බර් / අප්‍රේල් - මැයි)

10. ...................................... පොදු අරමුණු සිතියමකට නිදසුනකි.
(ලෝක සිතියම / භූමි පරිභෝග සිතියම / කාලගුණ සිතියම)

[දෙවැනි පිටුව බලන්න.

- **11** සිට **20** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් '**නි**' යන්න වටා ද, වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

11. පෘථිවි ප්‍රාවරණය 'සියල්' හා 'සිමැග්' යන ස්ථර දෙකෙන් සමන්විත ය. **නි / වැ**

12. පෘථිවියේ දක්ෂිණාර්ධගෝලයට අයත් කොටසෙහි, ගොඩබිම්වලට වඩා සාගර ප්‍රදේශ ව්‍යාප්ත වී ඇත. **නි / වැ**

13. ශ්‍රී ලංකාවේ පිහිටි හෝර්ටන් තැන්න 'තෙත් පතන' බිම් ගණයට අයත් වේ. **නි / වැ**

14. ශ්‍රී ලංකාවේ වතු ජනාවාස වැඩියෙන් ම ව්‍යාප්තව ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ ය. **නි / වැ**

15. නිවර්තන තෙත් වනාන්තරවල වෘක්ෂලතා තද කොළ පැහැයෙන් යුක්ත වන අතර වියන් ස්ථර කිහිපයකින් ද සමන්විත වේ. **නි / වැ**

16. ලෝකයේ ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩි ම රට නයිජීරියාවයි. **නි / වැ**

17. වර්ෂ 2011 ශ්‍රී ලංකාවේ ජන සංගණනයෙන් හෙළි වූ විශේෂ ලක්ෂණයක් වන්නේ පුම්තිරි අනුපාතය වැඩිවීමයි. **නි / වැ**

18. 'රික්ටර්' (Richter) පරිමාණය යොදා ගනු ලබන්නේ සුළඟේ වේගය මැනීම සඳහා ය. **නි / වැ**

19. 'ලැබ්‍රදෝර්' යනු ශීත සාගර ප්‍රවාහයකි. **නි / වැ**

20. යුගල අගයයන් දැක්වීම සඳහා වඩාත් උචිත ප්‍රස්තාරය ද්විත්ව තීරු ප්‍රස්තාරයයි. **නි / වැ**

- **21** සිට **30** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

21. ආග්නේය, අවසාදිත හා .................................... පාෂාණවලින් ශිලා ගෝලය නිර්මාණය වී ඇත.

22. පෘථිවියේ තැටි මායිම්වල චලනයන් අනුව, තැටි දෙකක් එකිනෙකට මුහුණලා ගමන් කරන ආකාරයට ක්‍රියාකරන තැටි මායිම්.................................... තැටි මායිම් ලෙස නම් කෙරේ.

23. ඕස්ට්‍රේලියාවේ පිහිටි සෞම්‍ය කලාපීය තෘණ භූමි .................................. යන නමින් හැඳින්වේ.

24. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතුරෙන් ග්‍රාමීය ජන සංඛ්‍යාවට වඩා නාගරික ජන සංඛ්‍යාව වැඩි දිස්ත්‍රික්කය වනුයේ .......................................... දිස්ත්‍රික්කයයි.


25. ලෝකයේ සක්‍රීය ගිනිකඳුවලින් 65% ක් ම ඇත්තේ.......................................... සාගරය අවට කලාපයේ ය.

26. ඇමෙරිකා එක්සත් ජනපදයේ සිලිකන් නිම්නය ................................ කර්මාන්ත සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.

/තුන්වැනි පිටුව බලන්න.

● පහත දැක්වෙන්නේ වර්ෂ 2006 සිට 2012 දක්වා වසර කිහිපයක ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය සහ අපනයන ඉපැයුම් ප්‍රමාණ දැක්වෙන ද්විත්ව තීරු ප්‍රස්තාරයකි. එය අධ්‍යයනය කොට අංක **27** සිට **30** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය හා අපනයනය 2006 - 2012




මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික හා සමාජ සංඛ්‍යාන වාර්තාව - 2013

27. ප්‍රස්තාරයට අනුව අඩු ම පොල් නිෂ්පාදනයක් සිදු වී ඇත්තේ ................................ වර්ෂයේ දී ය.

28. ප්‍රස්තාරයට අනුව අඩු ම අපනයන ආදායම ලැබී ඇත්තේ ................................ වර්ෂයේ දී ය.

29. නිෂ්පාදනය ඉහළ ම මට්ටමට ළඟා නොවුන ද අපනයන ඉපැයීම්වල විශාල වර්ධනයක් දක්නට ලැබෙන්නේ ........................ වර්ෂයේ දී ය.

30. නිෂ්පාදනය ඉහළ ම මට්ටමට ළඟා වුව ද ..................... වර්ෂයේ දී අපනයන ඉපැයීම්වල පහළ වැටීමක් දක්නට ඇත.

● **31** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා, ඊට හිමි අංකය ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියා දක්වන්න.

31. රටක ජන සනත්වය කෙරෙහි බලපෑමක් ඇති **නොකරන** සාධකය මින් කවරක් ද?
(1) යටිතල පහසුකම් (2) සේවා පහසුකම්
(3) වයස් ව්‍යුහය (4) රාජ්‍ය ප්‍රතිපත්ති (.........)

32. ජන සංඛ්‍යා පිරමීඩයක මුදුන පළල් වීම තුළින් පැහැදිලි වන්නේ,
(1) ළමා වයස් ජන සංඛ්‍යාව වැඩි වී ඇති බවයි.
(2) වියපත් ජන සංඛ්‍යාව අධික වී ඇති බවයි.
(3) ළමා වයස් ජන සංඛ්‍යාව අඩු වී ඇති බවයි.
(4) පුම්තිරි අනුපාතය වැඩි වී ඇති බවයි. (.........)

33. ගුවන් විදුලි තරංග විසුරුවා හැරීම සඳහා උපකාරී වන්නේ වායුගෝලයේ ස්ථර අතුරෙන් පහත සඳහන් කවරක් ද?
(1) පරිවර්තී ගෝලයයි. (2) අපරිවර්තී ගෝලයයි.
(3) තාප ගෝලයයි. (4) මෙසෝ ගෝලයයි. (.........)

/හතරවැනි පිටුව බලන්න.

34. ගොඩබිමින් සම්පූර්ණයෙන් වට වූ මුහුදු දෙක වනුයේ,
(1) මළ මුහුද හා රතු මුහුදයි.
(2) කැස්පියන් මුහුද හා මළ මුහුදයි.
(3) එරල් මුහුද හා රතු මුහුදයි.
(4) කළු මුහුද හා කැස්පියන් මුහුදයි. (.........)

35. විකීර්ණ ජනාවාසයක ලක්ෂණයක් වන්නේ මින් කවරක් ද?
(1) කෘෂිකාර්මික කටයුතු බහුල වීම
(2) නගරය හා සම්බන්ධතා වැඩි වීම
(3) යටිතල පහසුකම් අධික වීම
(4) ජන පීඩනය අධික වීම (.........)

36. ශ්‍රී ලංකාව තුළ ස්ඵටික හුනුගල් බහුලව දක්නට ලැබෙන ප්‍රදේශය කුමක් ද?
(1) මහනුවර
(2) පුත්තලම
(3) යාපනය
(4) අම්බලන්ගොඩ (.........)

37. සංක්‍රමණ ඇති වීමට බලපාන හේතු අතුරෙන් තල්ලු කිරීමේ සාධකයක් හා ඇදගැනීමේ සාධකයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රැකියා දුලභවීම - නිවාස හිඟ වීම
(2) අඩු අධ්‍යාපන මට්ටම - යුද්ධ හා ත්‍රස්තවාදී ක්‍රියා
(3) යටිතල පහසුකම් අඩු වීම - උසස් ජීවන මට්ටම
(4) රැකියා සුලභ වීම - ඉහළ ආදායම් අවස්ථා (.........)

38. ශ්‍රී ලංකාවේ කජු වගාව ව්‍යාප්ත වී ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක කුමක් ද?
(1) මාතලේ හා හම්බන්තොට
(2) මන්නාරම හා අනුරාධපුරය
(3) කුරුණෑගල හා පුත්තලම
(4) පුත්තලම හා මන්නාරම (.........)

39. ශ්‍රී ලංකාවේ මුහුදු දඹයක් දක්නට ඇති ස්ථානයක් වන්නේ,
(1) ත්‍රිකුණාමලය ය. (2) දෙවුන්දර ය. (3) ආරුගම් බොක්ක ය. (4) බේරුවල ය. (.........)

40. එකම රටක පිහිටි නාගරික සමුහිත දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) බොස්ටන්, වොෂින්ටන්
(2) කල්කටා, යොංගොන්
(3) බර්මිංහැම්, රූර්
(4) බර්ලින්, පැරිස් (.........)

The National e-learning Portal for The General Education

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

72474

## භූගෝල විද්‍යාව II

* මෙම ප්‍රශ්න පත්‍රය I, II, III වශයෙන් කොටස් **තුනකින්** සමන්විත ය.
* I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි **'අ', 'ආ'** සහ **'ඉ'** කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **දෙකකටත්**, III කොටසින් ප්‍රශ්න **දෙකකටත්** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 9) යොදා ගන්න. අංක (i) සිට (iv) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සිතියමෙහි AB රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(උත්තල බෑවුම / අවතල බෑවුම / මොහොර බෑවුම) (ලකුණු 01 යි)

(ii) PQ රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(තීර්යක් නිම්නය / ආයත නිම්නය / ගෙල කපොල්ල) (ලකුණු 01 යි)

(iii) සිතියම් ප්‍රදේශයේ කඳුවැටි විහිදී ඇති දිශාව කුමක් ද?
(උතුරු - දකුණු / වයඹ - ගිනිකොණ / නිරිත - ඊසාන) (ලකුණු 01 යි)

(iv) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ජලවහන රටාව නම් කරන්න.
(ශාඛීය / අරීය / ජාලාකාර) (ලකුණු 01 යි)

(v) D අක්ෂරයෙන් දක්වා කොටුකර ඇති ප්‍රදේශයේ ක්ෂේත්‍රඵලය වර්ග කිලෝමීටර කීය ද? (ලකුණු 01 යි)

(vi) E හා F අතර විහිදෙන පරිපාලන මායිම කුමක් ද? (ලකුණු 01 යි)

(vii) එම පරිපාලන මායිමේ විහිදීම තීරණය කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇති භෞතික ලක්ෂණය කුමක් ද? (ලකුණු 01 යි)

(viii) G අක්ෂරයෙන් දක්වා කොටුකර ඇති මංසන්ධි ජනාවාසයෙහි සම්මත ලකුණින් දක්වා ඇති රාජ්‍ය ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ix) C අක්ෂරයෙන් දක්වා ඇති ස්ථානය හරහා විහිදෙන දේශාංශ රේඛාවේ වටිනාකම නිවැරදිව සඳහන් කරන්න. (ලකුණු 01 යි)

(ආ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට, පහත අංක (i) සිට (v) දක්වා දී ඇති දෑ, සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි (පිටු අංක 10) **ලකුණු කර නම් කරන්න.**

(i) ඇමේසන් ගංගාව
(ii) ග්‍රිනිච් නගරය
(iii) කාපන්ටේරියා බොක්ක
(iv) මැඩගස්කර් දූපත
(v) යූරල් කඳුවැටිය (ලකුණු 05 යි)

[ හයවැනි පිටුව බලන්න.


(ඉ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට, පහත අංක (i) සිට (v) දක්වා ඇති දෑ, සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි (පිටු අංක 10) **ලකුණු කර නම් කරන්න.**

(i) මාතර නගරය
(ii) කල්පිටිය අර්ධද්වීපය
(iii) කන්කසන්තුරේ වරාය
(iv) සබරගමුව කඳු
(v) සංගමන්කන්ද තුඩුව

(ලකුණු 05 යි)

## II කොටස

2. ජල චක්‍රයෙහි විවිධ අවස්ථා දක්වන රූප සටහනක් පහත දැක්වේ. එය හොඳින් අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) රූප සටහනට අනුව ජල චක්‍රයෙහි E හා P අවස්ථා **දෙක** මොනවා දැ'යි නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) භූගත ජලයේ පිහිටීම අනුව ප්‍රභේද **තුනක්** හඳුනාගත හැකි ය. ඒවා මොනවා දැ'යි **නම් කරන්න.** (ලකුණු 03 යි)

(iii) (a) වර්තමානයෙහි ලොව බොහෝ රටවල් පානීය ජල හිඟයකට මුහුණපා ඇත. ඊට හේතු **දෙකක්** සඳහන් කරන්න.


(b) පානීය ජල හිඟය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3. (i) සියුම් පාරිභෝගික කෘෂිකර්මයට වැදගත් වන ආසියාවෙන් බැහැර රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වී වගාවට බලපාන,
(a) භෞතික සාධක **දෙකක්** හා
(b) මානව සාධක **එකක්**
සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ලෝකයේ සත්ත්ව පාලනය හා සම්බන්ධ නව ප්‍රවණතා **තුනක්** සඳහන් කරන්න.
(b) සත්ත්ව පාලනයෙහි නිරත වන රටවල් මුහුණපාන සත්ත්ව පාලනය හා සම්බන්ධ ගැටලු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

- අංක **4** සහ **5** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ලෝක සිතියම ආධාර කර ගන්න.




**4.** (i) ඉහත ලෝක සිතියමෙහි **A** හා **B** අක්ෂරවලින් දක්වා ඇති කපු වගාවට ප්‍රසිද්ධ රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ නම් කළ එක් රටක කපුපිළි කර්මාන්තයේ දියුණුවට බලපා ඇති සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ලෝකයේ කපුපිළි කර්මාන්තය සම්බන්ධ නව ප්‍රවණතා **තුනක්** සඳහන් කරන්න.

(b) කපුපිළි කර්මාන්තයේ නියුතු රටවල් එම කර්මාන්තය සම්බන්ධයෙන් වර්තමානයේ මුහුණ පා ඇති ගැටලු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**5.** (i) ඉහතින් දී ඇති ලෝක සිතියමෙහි

(a) **C** අක්ෂරයෙන් දක්වා ඇති මහාද්වීපයෙහි වාසය කරන ආදිවාසී ජන කොට්ඨාසයක් ද,

(b) **D** අක්ෂරයෙන් දක්වා ඇති මහාද්වීපයෙහි වාසය කරන ආදිවාසී ජන කොට්ඨාසයක් ද,

පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ නම් කරන ලද එක් ජන කොට්ඨාසයක් පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ලෝකයේ වාසය කරන සියලු ම ආදිවාසීන් සතු පොදු ගතිලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(b) ලෝකයේ ආදිවාසී ජන කොට්ඨාස වර්තමානයේ මුහුණ දී ඇති අභියෝග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)


## III කොටස

**6.** (i) යාබදව දැක්වෙන සිතියමෙහි ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප **A, B, C, D** හා **E** යනුවෙන් දක්වා ඇත. ඒවායින් **A** හා **B** කලාප දෙක මොනවා දැ'යි පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) **A** කලාපය ආර්ථික වශයෙන් වැදගත් වීමට හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (a) **D** කලාපයට බහුලව බලපාන ස්වාභාවික ආපදාව කුමක් දැ'යි නම් කොට, ඊට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න.

(b) එම ආපදාවෙන් සිදුවන හානි අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)



7. (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන්,
(a) වැසි ජලයෙන් වී වගා කරන දිස්ත්‍රික්කයක් ද
(b) වාරි ජලයෙන් වී වගා කරන දිස්ත්‍රික්කයක් ද
නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වර්තමානයේ ශ්‍රී ලංකාවේ වී ගොවිතැන ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සහල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගකරණය කිරීමේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

8. (i) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පැරණි ජනාවාස වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාස සංවර්ධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) වර්තමානයේ කොළඹ පුරවරයට අයත් ප්‍රදේශවල ජනාවාස සංවර්ධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** පැහදිලි කරන්න. (ලකුණු 05 යි)

9. (i) ශ්‍රී ලංකාවේ,
(a) ජන ඝනත්වය වැඩිම දිස්ත්‍රික්කය ද
(b) ජන ඝනත්වය අඩුම දිස්ත්‍රික්කය ද
පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජන සංඛ්‍යා වර්ධනයට බලපාන සාධක **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ජන සංක්‍රමණ නිසා සිදුවන වාසි **දෙකක්** සඳහන් කරන්න.
(b) ජන සංක්‍රමණ මගින් සිදු වන අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

ඉ-තක්සලාව The National e-learning Portal for The General Education

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர(சாதாரண தர) ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

විභාග අංකය
சுட்டெண்
Index Number ..................................

72474

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

1. (අ) /(அ) /(a)

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(iv) ..........................................................................................

(v) ..........................................................................................

(vi) ..........................................................................................

(vii) ..........................................................................................

(viii) ..........................................................................................

..........................................................................................

(ix) ..........................................................................................

10

මෙතැනින් කපන්න

The National e-learning Portal for The General Education

(ආ) /(ஆ) /(b)




(ඉ) /(இ) /(c)




The National e-learning Portal for The General Education

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**61 II**

72474

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

**භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II**




SCALE 1: 50,000